# සෑගිරිය හා මහා විහාරය ආශ්‍රිත මහායාන තාරා දෙවඟන වන්දනය පිළිබඳ වසම්මලේ හා වෙස්සගිරි ලෙන් සිතුවම් ආශ්‍රයෙන් පුරාවිද්‍යාත්මක අධ්‍යයනයක්

කෝණකුඹුක්වැවේ පඤ්ඤාලෝක හිමි[1]

මහායාන දර්ශනය ලක්දිව පැතිර ගියේ අභයගිරි ධම්මරුචි නිකාය හා ජේතවන සාගලික නිකාය කේන්ද්‍ර කරගෙනය. ඔවුහු තම අදහස් ජනවිඤ්ඤාණ ගත කිරීමට ආමිසයට මූලිකත්වය ගෙන ක්‍රියා කළහ. එහිදී බෝධිසත්ත්ව වන්දනාව, ශාරීරික ධාතු වන්දනාව වැනිආගමික අංග විෂයයෙහි වැඩි නැඹුරුවක් දක්වා තිබේ. ඒ අනුව ඉන්දියාවේ මෙන්ම ශ්‍රී ලංකාවේ ද ක්‍රි. ව. 3 වැනි සියවසේ අග භාගයේ හෝ ඊට ආසන්න කාලයක පටන් ගත් යැයි උපකල්පනය කරන ලංකාවේ බෝධිසත්ත්ව වන්දනය 6-9 සියවස්වල වර්ධනීය සාධක පෙන්වයි. ලංකාවේ බෝධිසත්ත්ව වන්දනාව මෙන්ම එම බෝධිසත්ත්වයන්ගේ ශක්තීන් වන්දනය ද පැවති බවට සාධක හමුවේ. මෙම සංකල්පය ස්ත්‍රීන් දේවත්වයෙන් අගයන තන්ත්‍රයානික අදහස් ලක්දිව වර්ධනය වීමත් සමඟම එකතු වූ බව උපකල්පනය කළ හැකිය. මෙසේ ලක්දිව පූජනීයත්වයට පත් වූ බෝධිසත්ත්ව ශක්තීන් අතර සංසාරයෙන් සත්ත්වයන් එතෙර කරන්නී යන අර්ථය ගැබ් ව ඇති තාරා දෙවිඳුව වන්දනය ප්‍රධානය. තාරා දෙවිඳුව යනු අවලෝකිතේශ්වර ශක්තිය ය.

තන්ත්‍රයානිකයෝ අෂ්ට සහශ්‍රික ප්‍රඥා පාරමිතා සූත්‍රය සංක්ෂේප කර ප්‍රඥා පාරමිතා හෘදය සූත්‍ර ධාරණිය බිහි කළහ. ප්‍රඥා පාරමිතා දේවිය නමින් හඳුන්වනුයේ තාරා දෙවඟනය.අනුරාධපුර විජයාරාම ස්තූපයෙන් තාරා දෙවඟන උදෙසා වූ තඹ ලෝහයෙන් සකස් කළ ධාරණියක් හමු වී ඇත. ඒ අනුව තාරා දෙවඟන වන්දනය අනුරාධපුර ප්‍රචලිතව පැවති බවට මූලික අදහසකට එළඹිය හැකිය. එහෙත් තාරා දෙවඟන විෂයයෙහි විහාරාරාමවල අවකාශයක් ලබාදීමේ තොරතුරු සොයා ගැනීම සඳහා මිහින්තලය සිවුවන මිහිඳු රජුගේ පුවරු ලිපිය වැදගත්ය. ප්‍රතිසංස්කරණය සඳහා වස්තූන් තැන්පත් කළ පඬුරුවලින් ආදායම් ලැබූ මණිනාල් දෙව්දු ගෘහය එහි සඳහන් කර ඇත. පරණවිතානයන්ට අනුව මණිනාල් දෙවිඳු යනු අවලෝකිතේශ්වර භාර්යාව වූ තාරා හැඳින්වීමට භාවිත පර්යාය පදයකි. මිහින්තල විහාරාරාමාශ්‍රිතව මෙම තාරා දෙවඟන වන්දනා කරන ආරාමය තිබිය යුතු අතරපෙන ගොබ හතකින් පසුපෙළ නිර්මිතවසම්මලේසිතුවම තාරා දෙවඟනගේ යැයි උපකල්පනය කළහැකිය. මෙම වසම්මලේ චිත්‍ර මෙන්ම වෙස්සගිරියේ B ලෙස නම් කර ඇති උතුරු-දකුණු දිසානුගත පර්වතයේ නවවන ලෙනෙහි සිතුවම්ද සමාන නිසා එයද තාරා දෙවඟනගේ යැයි උපකල්පනය කළ හැකි වේ.

එබැවින් අනුරාධපුර හා මිහින්තලේ ප්‍රදේශාශ්‍රිතව 6-9 සියවස්වල පැවති මහායානික අදහස්වලින් වර්ධනය වූ තාරා දෙවඟන වන්දනය ප්‍රචලිතව පැවති බවට උක්ත සිතුවම්වලින් අනාවරණය වේ. මහායානික හා හීනයානික බැතිමතුන් මෙම සංකල්පය අගය කරමින් ඒ විෂයයෙහි තම විඤ්ඤාණය මෙහෙය වූ බව පෙනෙන අතර ඒ සඳහා මුල් බැසගත් සංස්කෘතියක් පැවැති බව ඔප්පු කිරීම මෙහි දී බලාපොරොත්තු වේ.

**ප්‍රමුඛ පද:** විජයාරාම තාරා ධාරණිය, වසම්මලේ වෙස්සගිරි ලෙන් සිතුවම්, මහායාන සංකල්ප

---

1 පුරාවිද්‍යා අධ්‍යයන අංශය, දෙවන වසර (විශේෂවේදී), පේරාදෙණිය විශ්වවිද්‍යාලය